# මූල්‍ය කළමනාකරණය

"සංවිධානයක් සඳහා අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ග වලින් සපයා ගැනීම සහ එම අරමුදල් ඵලදායි ලෙස ව්‍යාපාර කටයුතු වල ආයෝජනය කරමින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීම හා සම්බන්ධ කටයුතු"

අවශ්‍ය අරමුදල් පිළිබඳ සැලසුම් කිරීම, අරමුදල් සම්පාදනය කර ගැනීම සහ ඒවා කාර්යක්ෂම සහ සඵලදායි ලෙස භාවිතා කිරීම මෙහි මූලික කාර්යයි.

මූල්‍ය කළමනාකරණයේ අරමුණු/ වැදගත්කම

1. හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය/ ධනය උපරිම කිරීම
2. ලාභය උපරිම කිරීම
3. ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම
4. ව්‍යාපාරයේ දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම
5. කොටසක ඉපයුම උපරිම කිරීම
6. යෝග්‍යම මාර්ග වලින් අරමුදල් රැස් කර ගැනීම

මූල්‍ය කළමනාකරණයේ දී ගනු ලබන තීරණ ප්‍රධාන කොටස් දෙකකි.

1. මූල්‍යන තීරණ
2. ආයෝජන තීරණ


**මූල්‍යන තීරණ**

අරමුදල් සම්පාදනය කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණයි.
එනම් ජංගම සහ ස්ථාවර වත්කම් වල ආයෝජනය සඳහා අරමුදල් සපයා ගැනීමට අදාළ වන තීරණ වේ.

**ආයෝජන තීරණ**

සපයා ගත් අරමුදල් ව්‍යාපාරයේ විවිධ අවශ්‍යතා සඳහා යොදවන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණ යි.
එනම් ජංගම සහ ස්ථාවර වත්කම් වල අරමුදල් යෙදවීම පිළිබඳ ගනු ලබන තීරණ වේ.

මූල්‍ය කළමනාකරණ තීරණ අනුව අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරය හා ඒවා ආයෝජනය කරන ආකාරය හඳුනා ගත් පසු යෝග්‍ය පරිදි අරමුදල් සපයා ගෙන ඒවා සඵලදායි මාර්ග වල ආයෝජනය කළ යුතුය.




**මූල්‍ය තීරණ සහ ආයෝජන තීරණ ප්‍රශස්ත ලෙස සිදු වීමට නම් ඒ සඳහා මූල්‍ය සැලසුම්කරණය සහ පාලනය අත්‍යවශ්‍ය සාධකයකි. මූල්‍ය සැලසුම්කරණ සහ පාලන උපකරණ ලෙස අයවැයකරණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ යොදා ගනියි.**

## 1. අයවැයකරණය

"නිශ්චිත අනාගත කාලච්ඡේදයක මුදල් ලැබීම සහ ගෙවීම් සැලසුම් කිරීම"
මුදල් අයවැයකරණයේදී ප්‍රධාන උපකරණ දෙකක් යොදා ගනියි.

### a) මුදල් අයවැය ලේඛනය

"කාලච්ඡේදයකට අදාළ මුදල් ලැබීම සහ මුදල් ගෙවීම් ඇතුලත් කොට සකස් කරනු ලබන ලේඛනය"

මුදල් අයවැය ලේඛනයක ප්‍රයෝජන/ වැදගත්කම

1. අනාගතයේ ඇති විය හැකි මුදල් අතිරික්තතා ඵලදායිව ආයෝජනය කල හැකි වීම
2. අනාගතයේ ඇති විය හැකි මුදල් ඌනතාවන්ට සාර්ථකව මුහුණ දීමට හැකි වීම
3. මුදල් පිළිබඳ සැලසුම්කරණය සහ පාලනය පහසු වීම
4. ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්වය තහවුරු කර ගැනීමට උපකාරී වීම

### b) ප්‍රාග්ධන අයවැයකරණය

"අනාගතයේ ප්‍රතිලාභ ඉපයීමේ අරමුණින් වර්තමානයේ පවතින අරමුදල් වඩා සඵලදායිව දිගු කාලීන වත්කම් හෝ ව්‍යාපෘති වල ආයෝජනය කිරීමට සැලසුම් කිරීම"
මූල්‍ය කළමනාකරු විසින් ගනු ලබන ප්‍රාග්ධන අයවැයකරන තීරණ, 'දිගුකාලීන ආයෝජන තීරණ' ලෙස හඳුන්වයි.

## 2. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

කිසියම් කලච්ඡේදයකට අදාළව ආයතනයක සත්‍ය හෝ අපේක්ෂිත මුදල් ගලා ඒම් සහ ගලා යාම් විශ්ලේෂණය කරන ප්‍රකාශය යි.
මෙය අතීත හෝ අනාගත කල්ච්ඡේදයක් සඳහා සකස් කළ හැකිය.

### ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා


ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ දැක්විය හැකිය.

i. **කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා**
එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල්
උදා : තොග මිලට ගැනීම, වැටුප් ගෙවීම්, දුරකථන වියදම්, විදුලි වියදම්

ii. **දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා**
ව්‍යාපාරය ආරම්භ කිරීමේදී මෙන්ම ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී මූලිකව අවශ්‍ය වන්නා වූ ස්ථාවර වත්කම් මිලට ගැනීමට අවශ්‍ය අරමුදල්
උදා : ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, රථවාහන

### අරමුදල් සම්පාදන මාර්ග

අරමුදල් සම්පාදන මාර්ග ප්‍රධාන ආකාර තුනකට වර්ග කල හැකිය.



අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. පිරිවැය අඩු වීම<br>2. ලබා ගැනීම පහසු වීම<br>3. ආපසු ගෙවීමේ අවශ්‍යතාවක් නොමැති වීම<br>4. ව්‍යාපාරයේ වගකීම් වැඩි නොවීම<br>5. විශේෂ කොන්දේසි නොමැති වීම | 1. විශාල අරමුදල් ප්‍රමාණයක් රැස් කර ගත නොහැකි වීම<br>2. කාරක ප්‍රාග්ධන ගැටළු මතු වීම |

බාහිර සම්පාදන මාර්ග වල වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. විශාල අරමුදල් ප්‍රමාණයක් රැස් කර ගැනීමට හැකි වීම<br>2. ව්‍යාපාරයේ හිමිකාරිත්වය පුළුල් වීම | 1. සපයා ගැනීමේ පිරිවැය වැඩි වීම<br>2. සපයා ගැනීම පහසු නොවීම<br>3. ඇප සුරැකුම් අවශ්‍ය වීම<br>4. ව්‍යාපාරයේ වගකීම් වැඩි වීම |

ඍජු සම්පාදන මාර්ග වල වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. අමතර පිරිවැයක් දැරීමට සිදු නොවීම<br>2. කොන්දේසි නොමැති වීම<br>3. ඕනෑම විටක සපයා ගත හැකි වීම<br>4. පහසුවෙන් සපයා ගත හැකි වීම | 1. ලාභාංශ සහ පොලි ගෙවීමට සිදු වීම |

වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. කළමනාකරණයට බලපෑමක් නොවීම<br>2. හිමිකමට බලපෑමක් නොවීම<br>3. ගෙවා නිදහස් කර ගැනීමට හැකි වීම | 1. නීතිරීති හා කොන්දේසි වලට යටත් වීම<br>2. වැඩි කාලයක් ගත වීම<br>3. පිරිවැය වැඩි වීම |

කෙටිකාලීන මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. දිගු කාලීන බැඳීම් ඇති නොවීම<br>2. ඉක්මනින් ලබා ගත හැකි වීම<br>3. කළමනාකරණයට සිදු වන බලපෑම අඩු වීම | 1. ආපසු ගෙවීමේ කාලය අඩු වීම<br>2. කාරක ප්‍රාග්ධන ගැටළු මතු වීම |

දිගුකාලීන මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි-අවාසි


| වාසි | අවාසි |
|---|---|
| 1. පියවීමට වැඩි කාලයක් පැවතීම<br>2. වාරික වශයෙන් පියවිය හැකි වීම | 1. ලාභාංශ සහ පොලී ගෙවිය යුතු වීම<br>2. ගෙවිය යුතු පොලී ප්‍රමාණය ඉහළ වීම<br>3. ඇප සුරැකුම් අවශ්‍ය වීම |

### මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

1. **අවශ්‍ය අරමුදල් ප්‍රමාණය**
2. **අරමුදල් අවශ්‍ය වන කාලය**
3. **පිරිවැය**
   අරමුදල් සපයා ගැනීම සහ ඒවා නඩත්තු කිරීම
   උදාහරණ ලෙස ව්‍යාපෘති වාර්තා සැකසීම, නීතිඥ ගාස්තු, පොලී වියදම්, වත්කම් සුරකුම් ලෙස බැඳීමට යන වියදම්
4. **ව්‍යාපාර සංවිධාන ස්වරූපය**
   කේවල, හවුල්, සමාගම් ආදී වශයෙන් ව්‍යාපාර සංවිධාන ක්‍රමය
5. **අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය**
6. **ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම**
   හිමිකම් ප්‍රාග්ධනයට සහ ණය ප්‍රාග්ධනයට වන බලපෑම පිළිබඳ සැලකිලිමත් වීම

## ආයෝජන තීරණ

ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුල හෝ පිටත වත්කම් වල යෙදවීම 'ආයෝජනය' ලෙස හඳුන්වයි.
ව්‍යාපාරයක ආයෝජනය සම්බන්ධයෙන් ගන්නා තීරණ ආයෝජන තීරණ ලෙස හඳුන්වයි.




ව්‍යාපාරයේ සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, විකල්ප ආයෝජන අවස්ථා හඳුනා ගත හැකි වීම, වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන තෝරා ගත හැකි වීම වැනි දෑ ආයෝජන තීරණ මඟින් සිදුවන නිසා ආයෝජන තීරණ ව්‍යාපාරයේ සාර්ථකත්වයට බලපායි.


### අරමුදල් ආයෝජනය කිරීමේදී සළකා බලන සාධක

1. **ආයෝජනයේ ප්‍රතිලාභ**
2. **ආයෝජනයේ අවධානම**
3. **ද්‍රවශීලතාව**
4. **පරිසර සාධක**
5. **ආයතනයේ ප්‍රතිපත්ති**
6. **ආයෝජනයේ පිරිවැය**
7. **නෛතික තත්වයන්**

## ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය

**"ආර්ථිකයක මූල්‍ය තීරණ ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටින මූල්‍ය වෙළඳපල, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ, සහ මූල්‍ය යටිතල පහසුකම් හි එකතුව"**

මූල්‍ය පද්ධතිය තුල සිදුවන වැදගත්ම කාර්යය වන්නේ **'මූල්‍ය අතරමැදිකරණය'** යි. එනම් අතිරික්ත අරමුදල් ඇති ඒකකයන්ගෙන් ඉතුරුම් ලබාගෙන ඒවා අරමුදල් හිඟ ඒකක වෙත ණය ලෙස සැපයීමයි.




### 1. මූල්‍ය උපකරණ

මූල්‍ය වෙළඳපල තුල ගනුදෙනු කිරීම සඳහා යොදා ගන්නා උපකරණ වේ.
මේවා කාණ්ඩ 3ක් යටතේ ඉදිරිපත් කළ හැකිය.

- **a. තැන්පතු**
  - ඉල්ලුම් තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු
- **b. ණය**
  - රජය නිකුත් කරන - භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර
  - සමාගම් නිකුත් කරන - ණයකර, වාණිජ පත්‍රිකා
  - වාණිජ බැංකු - ඒක්ෂණ ණය, තැන්පතු සහතික
- **c. සමාගම් කොටස්**
  - සාමාන්‍ය කොටස්, වරණිය කොටස්

### 2. මූල්‍ය ආයතන

මූල්‍ය පද්ධතිය තුල විවිධ මූල්‍ය උපකරණ ආශ්‍රිත ගනුදෙනු වල යෙදී සිටින සහ විවිධ මූල්‍ය සේවාවන් සපයන ආයතන
මෙය ප්‍රධාන කොටස් 4 කි.

a. බැංකු අංශය
b. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
c. අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන
d. ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන

## 3. මූල්‍ය යටිතල පහසුකම්

මූල්‍ය ක්‍රමයේ විධිමත් ක්‍රියාකාරිත්වය හා ස්ථායිතාව සඳහා ආධාර වන ගෙවීම් හා පියවීම් පද්ධති

a. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS)
b. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය (CTS)
c. නිර්ලේඛන සුරකුම්පත් තැන්පතු පද්ධතිය (SSSS)
d. ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය (SWIFT)

## 4. මූල්‍ය වෙළඳපල

කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය උපකරණ මිලට ගැනීම සහ විකිණීම සිදුවන සමස්ත වෙළඳපල යි. මෙය භෞතික ලෙස මෙන්ම විද්‍යුත් ලෙසද පැවතිය හැකිය. මෙය ප්‍රධාන කොටස් දෙකකි.

### a. මුදල් වෙළඳපල

වසරකට වඩා අඩු කාලයකින් පරිණත වන මූල්‍ය උපකරණ හුවමාරු වන වෙළඳපලයි.
මෙහි ප්‍රධාන කාර්යය වන්නේ ආර්ථිකයේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමයි.
මෙහි උප වෙළඳපලවල් 4 කි.

i. **අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල**
වාණිජ බැංකු වල කෙටිකාලීන ද්‍රවශීලතා ගැටළු පාලනය කිරීම සඳහා සංවිධානය වී ඇති වෙළඳපලයි. ද්‍රවශීල හිඟයන් සඳහා ද්‍රවශීල අතිරික්තතා ඇති වාණිජ බැංකු වලින් දින 7 හෝ ඊට අඩු කාලයකින් ගෙවීම සඳහා ණය ලබා ගැනීම මෙහිදී සිදුවේ.

ii. **භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල**
රජයට අවශ්‍ය කෙටිකාලීන ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් විකිණීම සහ මිලදී ගැනීම සිදුවන වෙළඳපලයි. මෙය කොටස් 2 කි.

- **ප්‍රාථමික වෙළඳපල**
  මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන්ට භාණ්ඩාගාර බිල්පත් අලෙවි කරන වෙළඳපල
- **ද්විතියික වෙළඳපල**
  ප්‍රාථමික වෙළඳපලෙන් මිලදී ගත්, කල්පිරෙන තෙක් තබා නොගන්නා භාණ්ඩාගාර බිලපත් විකිණීම සහ මිලදී ගැනීම සිදුවන වෙළඳපල

iii. **වාණිජ පත්‍රිකා වෙළඳපල**
සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීමට නිකුත් කරන වාණිජ පත්‍රිකා විකිණීම සහ මිලට ගැනීම සිදුවන වෙළඳපල යි.

iv. **විදේශ විනිමය වෙළඳපල**
රටෙහි විදේශ විනිමය මඟින් කෙටිකාලීන ණය ගැනීම සහ ණය සැපයීම සිදු වන වෙළඳපලයි. එනම් වාණිජ බැංකු වල විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වලට අදාළව සිදුවන කටයුතු වේ. අපනයනකරුවන් ලබන විදේශ විනිමය ලබාදී රුපියල් ලබා ගැනීම, ආනයනකරුවන් රුපියල් ලබා දී විදේශ විනිමය ලබා ගැනීම, ණයවර ලිපි නිකුත් කිරීම, විදේශ බැංකු අණකර නිකුත් කිරීම ආදිය මේ යටතේ සිදුවේ.

**b. ප්‍රාග්ධන වෙළඳපල**

වර්ෂයකට වඩා වැඩි කාලයකින් පරිණත වන මූල්‍ය උපකරණ හුවමාරු වන වෙළඳපලයි. මෙහි ප්‍රධාන කාර්යය වන්නේ විවිධ ඒකක වලට අවශ්‍ය දිගු කාලීන අරමුදල් සැපයීමයි. මෙය උප වෙළඳපලවල් 3කින් සමන්විතය.

**i. භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපල**

රජයට අවශ්‍ය මධ්‍ය හා දිගු කාලීන ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු වන වෙළඳපල යි.
සුරක්ෂිත මූල්‍ය උපකරණයක් වන මෙය රුපියල් දස දහස් ගුණිතයන්ගෙන් මිලදී ගත හැකි අතර වසර 2-30 දක්වා කල්පිරෙන කාලයන්ගෙන් නිකුත් කරයි.

**ii. සාංසමික බැඳුම්කර වෙළඳපල**

රාජ්‍ය සංස්ථා සහ සමාගම් විසින් මධ්‍ය හා දිගු කාලීන ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ණයකර අලෙවි කිරීම සම්බන්ධ වෙළඳපල යි.

**iii. කොටස් වෙළඳපල**

## කොටස් වෙළඳපල

**"ලැයිස්තුගත පොදු සමාගම් වල කොටස් මිලදී ගැනීම සහ විකිණීම පරිපාලනය කරන ආයතනය"**

මෙය ඇපයෙන් සීමිත සමාගමකි.

මෙහි පූර්ණ සාමාජිකයන් ලෙස තැරව්කාර සමාගම් ක්‍රියාත්මක වන අතර ඔව්හු කොටස් වෙළඳපලේ අතරමැදියන් ලෙස කටයුතු කරති.

මෙහි කටයුතු විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම 'ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව' විසින් සිදු කරනු ලැබේ.

**කොටස් වෙළඳපලෙහි වැදගත්කම**

1. **සමාගම් වල අරමුදල් අවශ්‍යතා සපුරාලීම**
2. **සමාගම් කොටස් සඳහා ද්විතියික වෙළඳපලක් ඇති වීම**
3. **විදේශ ආයෝජන ගලා ඒම**
4. **රජයේ සුරකුම්පත් අලෙවියෙන් රජයට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගත හැකි වීම**
5. **සමාගම් කොටස් වලට වටිනාකමක් නිර්මාණය වීම**
6. **සමාගම් වල කීර්තිනාමය ඉහළ යාම**
7. **ආයෝජකයන්ට කොටස් වෙළඳපල හරහා විවිධ ප්‍රතිලාභ ලැබිය හැකි වීම**

කොටස් වෙළඳපල ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය.

1. ප්‍රාථමික වෙළඳපල
   සමාගමකින් ආයෝජකයන් සෘජුවම කොටස් මිලට ගැනීම මෙහිදී සිදුවේ.

2. ද්විතියික වෙළඳපල
   කොටස් වෙළඳපලෙන් කොටස් මිලදී ගැනීම මෙහිදී සිදුවේ.

**කොටස් වෙළඳපලේ ලියාපදිංචි විය හැකි ආකාර 3 කි.**

1. **මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මඟින්**
   සමාගමක් පළමු වරට කොටස් නිකුත් කිරීමක් මඟින් මහජනයාට දායක වීමට ඇරයුම් කර කොටස් වෙළඳපලේ ලැයිස්තුගත කිරීම

2. **විකුණුම් අර්පණයක් මඟින්**
   දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක්, මහජනතාව සතුව ඇති කොටස්, කොටස් වෙළඳපලෙන් විකිණීමට ඉදිරිපත් කිරීම සඳහා ලැයිස්තුගත කිරීම

3. **හඳුන්වා දීමක් මඟින්**
   මහජනතාවට කොටස් නිකුත් කිරීමක් සිදු නොකර, හඳුන්වාදෙන අවස්ථාවේදීම කොටස් වෙළඳපල හරහා කොටස් නිකුත් කිරීම

**ලියාපදිංචි සියළුම සමාගම් පුවරු 2ක් යටතේ ලැයිස්තුගත කිරීම සිදුවේ.**

1. **ප්‍රධාන පුවරුව**
   විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත සමාගම් සඳහා පමණක් වෙන් කර ඇති පුවරුවයි.
   ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සමාගමක් සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයකි.
   - ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 500 ට නොඅඩු වීම
   - නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් 25% ක් වත් මහජනයා සතු වීම
   - අඛන්ඩව වසර තුනක් බදු පෙර ශුද්ධ ලාභ ලබා තිබීම (ඉල්ලුම් කරන දිනට පෙර)
   - ශුද්ධ වත්කම් වසර දෙකක විගණනය කළ මූල්‍ය වාර්තා මඟින් තහවුරු වීම (ඉල්ලුම් කරන දිනට ආසන්න වර්ෂ දෙකක)

2. **දිරිසවි පුවරුව**
   සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත සමාගම් ලැයිස්තුගත කිරීමට වෙන් වූ පුවරුවයි.
   දිරිසවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සමාගමක් සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයකි.
   - ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 100 ට නොඅඩු වීම
   - නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් 10% ක් වත් මහජනයා සතු වීම
   - ක්‍රියාකාරී කාල සීමාව අවම වශයෙන් වසරක් වීම
   - ශුද්ධ වත්කම් වසරක විගණනය කළ මූල්‍ය වාර්තා මඟින් තහවුරු වීම (ඉල්ලුම් කරන දිනට ආසන්න වසර)

වොච් ලිස්ට් පුවරුව

කොටස් වෙළඳපලේ ලැයිස්තුගත කිරීමේ කොන්දේසි කඩ කරන හෝ නොපිළිපදින සමාගම් ඇතුළත් කරන පුවරුවයි. මෙය පෙරදී හඳුන්වනු ලැබුවේ 'කඩකළ පුවරුව' යනුවෙනි.

## කොටස් වෙළඳපල තුළ ගනුදෙනු වන සුරැකුම්පත්

1. **සාමාන්‍ය කොටස්**
   මිලදී ගත් විට සමාගමේ අයිතිය හිමිවන කොටස් වේ.
   ලාභාංශයක් හිමිවන නමුත් එය ස්ථිර එකක් නොවේ. අවධානම් වැඩිය.
   වාර්ෂික මහසභා රැස්වීම් වලට සහභාගී වීමට හැකි අතර පාලන බලතල හිමිවේ.
   සාමාන්‍ය කොටස් වර්ග 2කි.
   a. ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස්
   b. ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස්

2. **වරණීය කොටස්**
   මිලදී ගත් විට සමාගමේ අයිතිය හිමි නොවන අතර මෙය සමාගමට ණයක් සැපයුවා හා සමාන ය.
   නිශ්චිත ලාභාංශයක් හිමි නිසා මෙන්ම සමාගම විසිරුවා හරින අවස්ථාවකදී ප්‍රාග්ධනය ආපසු ගෙවීමට ප්‍රමුඛත්වයක් හිමිවන නිසා අවධානම අඩුය. පාලන බලතල හිමි නොවේ.

3. **කොටස් බලපත්‍ර**
   අනාගතයේ නිශ්චිත මිලකට සමාගමක කොටස් මිලට ගැනීමට අයිතිය ලබා දෙමින් වර්තමානයේ සමාගම විසින් නිකුත් කරන ලියවිල්ලකි.
   මේ හරහා ප්‍රතිලාභ ලැබීමට නම් එය කල්පිරෙන තෙක් ළඟ තබා ගත යුතුය.

4. **සාංසමික ණයකර**
   සමාගමට ණය ප්‍රාග්ධනය ලබා ගැනීම සඳහා නිකුත් කරන සුරැකුම්පත් විශේෂයකි.
   නිශ්චිත පොලි ප්‍රතිශතයක් හිමිවේ.

5. **රජයේ සුරැකුම්පත්**
   රජය විසින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මීට අයත් වේ.
   අවදානම ඉතාමත් අඩුය. ස්ථාවර පොලී අනුපාතයක් නොමැති අතර කලින් කලට විවිධ පොලී අනුපාත යටතේ මේවා නිකුත් කරයි.

## කොටස් වෙළඳපලේ ආයෝජනයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ

1. **ඍජු ප්‍රතිලාභ**
   a. ලාභාංශ - සාමාන්‍ය කොටස්, වරණීය කොටස් සඳහා
   b. පොලී - ණයකර සඳහා
   c. ප්‍රාග්ධන ලාභ
      ගැනුම් මිලට වඩා වැඩි මිලකට කොටස් විකිණීම තුලින් ලබන ලාභයි. මෙම අදායම බදු වලින් නිදහස් අතර මෙය කොටස් වෙළඳපල හරහා ලැබෙන අක්ර්ශනියම ප්‍රතිලාභයයි.
   d. හිමිකම් නිකුතුව
   e. සංචිත ප්‍රග්ධනිකරණය

2. **වක්‍ර ප්‍රතිලාභ**
   a. සමාගම් වල පාලන බලතල හිමි වීම
   b. රජයේ සුරැකුම්පත් ණය ඇප වශයෙන් භාවිතා කළ හැකි වීම
   c. රජයේ සුරැකුම්පත් වල අවධානම ඉතා අඩු වීම
   d. කොටස් විකිණීමෙන් ලබන ප්‍රාග්ධන ලාභ බදු වලින් නිදහස් වීම
   e. කොටස් අවශ්‍ය විටක මුදල් බවට පත් කර ගත හැකි වීම
   f. ප්‍රසාද නිකුතු වලට හිමිකම් ලැබීම

**කොටස් වෙළඳපල කාර්යසාධනය මැනීම**

කොටස් වෙළඳපල ගනුදෙනු ක්‍රියාකාරීද නැත්ද යන්න විග්‍රහ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිතා වන ප්‍රධාන මිල දර්ශක කිහිපයකි.

1. **සියලු කොටස් මිල දර්ශකය (ASPI)**
   ලැයිස්තුගත සමාගම් සියල්ලේම ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස් වල මිල ගණන්හි ඇති වන උච්ඡාවචන පෙන්නුම් කරන මිල දර්ශකයයි.
   මෙය සකස් කිරීමේදී 1985 පාද වර්ෂය ලෙස යොදා ගනියි.
   පාදක දර්ශක අගය 100 ලෙස යොදා ගනියි.

$$ASPI = \frac{\text{ලැයිස්තුගත සමාගම් වල වර්තමාන වෙළඳපල ප්‍රාග්ධනීකරණය}}{\text{පදනම් වර්ෂයේ වෙළඳපල ප්‍රාග්ධනීකරණය}} \times 100$$

2. **S & P ශ්‍රී ලංකා 20 දර්ශකය**
   කොටස් වෙළඳපල තුල විශාලතම සහ වඩාත් ද්‍රවශීල සමාගම් 20 ක කොටස් මිල ගණන් වෙනස් වීම මැනීම සඳහා ගණනය කරයි.
   පාදක දිනය 2004.12.17 ලෙසත් පාදක දර්ශක අගය 1000 ක් ලෙසත් සලකයි.
   මෙම සමාගම් තෝරා ගැනීම සඳහා පහත නිර්ණායක තෝරා ගනියි.
   - වෙළඳපල ප්‍රග්ධනිකරණය
   - ද්‍රවශීලතාව
   - මූල්‍ය ශක්‍යතාව

$$S\&P = \frac{\text{තෝරාගත් සමාගම් 20 වර්තමාන වෙළඳපල ප්‍රාග්ධනීකරණය}}{\text{තෝරාගත් සමාගම් 20 පාදක දිනයේ වෙළඳපල ප්‍රාග්ධනීකරණය}} \times 100$$

3. **මුළු ප්‍රතිලාභ දර්ශකය (TRI)**
   කොටස් මිල වෙනස්වීම සහ ලාභාලාභ ආදායම් යන දෙකම සැලකිල්ලට ගනිමින් සකස් කරන මෙය දෛනිකව සකස් කරයි.
   2004 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී.
   - සියලු කොටස් මිල දර්ශකය මුළු ප්‍රතිලාභ පදනම යටතේ ගණනය කල විට සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය (ASTRI) ලෙසත්,
   - S&P ශ්‍රී ලංකා 20 දර්ශකය මුළු ප්‍රතිලාභ යටතේ ගණනය කල විට S&P ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය ලෙසත් හඳුන්වයි.

**කොටස් වෙළඳපල මිල දර්ශක වල වැදගත්කම**

1. ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම
2. සමාගම් වල කාර්යසාධනය පිළිබඳ අදහසක් ලබා ගත හැකි වීම
3. වෙනත් රටවල කොටස් වෙළඳපල තත්වයන් සමඟ සැසඳිය හැකි වීම
4. ආයෝජන තීරණ ගැනීමට උපකාරී වීම